**විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහායක ව්‍යාපෘතිය - 2022**

---

විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ සහායක ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3409 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. විදුලිබලය සැපයීමේ සහ බෙදාහැරීමේ පද්ධතිවල කාර්යක්ෂමතාව සහ විශ්වසනීය බව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 24,228 කට සමාන වූ එජඩො මිලියන 160.20 වන අතර ඉන් රු. මිලියන 17,392 කට සමාන වූ එජඩො මිලියන 115 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල රු. මිලියන 6,836 කට සමාන වූ එජඩො මිලියන 45.2 ලංකා විදුලිබල මණ්ඩලය විසින් මූල්‍යනය කිරීමට බලාපෙරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කරන ලද අතර, 2023 නොවැම්බර් 29 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුවේ ණය ශේෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -21 අනුව වාර්තා කළ දිනයේ LKR අගයට පරිවර්තනය කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව | අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ ශාඛා ගිණුම් කට්ටලයක් ලෙස ව්‍යාපෘති ගිණුම් ක්‍රමවත්ව දැක්වීම ලංකා විදුලිබල මණ්ඩලයේ භාවිතය වේ. මෙය ඉතිහාසය පුරාවටම විගණකවරුන් සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් නිසි ලෙස පිළිගෙන ඇති අතර මෙතෙක් කිසිදු විමසීමක් සිදුකර නොමැත. අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) යටතේ සියලුම ව්‍යාපෘති ක්‍රියාත්මක | මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂය සහ සංවර්ධන වියදම් ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | කරනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ සාමාන්‍යයෙන් පිළිගත් මූලධර්මවලට අනුකූලව විසර්ජන සහ අදාළ වත්කම් ඉදිකිරීම වාර්තා කරන අතරතුරය. ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සියලුම ගනුදෙනු පොදු ලෙජරයේ සටහන් කර ඇත. අදාළ ණය මුදල් අමාත්‍යාංශයේ මඟපෙන්වීමට අනුකූලව ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කළමනාකරු විසින් නඩත්තු කිරීම සහ පරිපාලනය කිරීම සහ පියවීම සිදු කරයි. එබැවින්, ලංකා විදුලිබල මණ්ඩල මූලස්ථානයේ පොදු ලෙජරය යටතේ ණය සටහන් කර ඇත. | |
| (ආ) | පෙර වසරවල ගෙවිය යුතු දෑ යටතේ පෙන්වා ඇති රු.මිලියන 20.8ක ප්‍රමාද හානි 2021 වර්ෂයේ වෙනත් ආදායමක් ලෙස සටහන් කර තිබුණි. කෙසේ වෙතත්, ආදායම යටතේ ප්‍රමාද හානි ගිණුමට එය බැර කිරීම සිදු කර තිබුණි. | මෙම හිමිකම් පෑම බෙදාහැරීමේ අංශය 02 මගින් සිදු කරන ලද පැකේජ 1 ලොට් 1 හි ප්‍රමාද හානිවලට සම්බන්ධ වේ.2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ආදායමක් ලෙස එම වටිනාකම R1300 යටතේ සටහන් කර තිබුණි. 2021 වර්ෂය සඳහා සිදු කරන ලද විගණනයට අනුව විගණකවරයාගේ මතය වූ ආදායම අදාළ ආදායම් කේතය R1315 වෙත මාරු කිරීම (ප්‍රමාද හානි) 2022 වර්ෂය තුළ අප විසින් අනුගමනය කරන ලදි. | පෙර වර්ෂයේ විගණන නිරීක්ෂණයට අනුව, ප්‍රමාද හානිය ව්‍යාපෘතියේ ආදායම යටතේ නොපෙන්විය යුතුය. නිවැරදි ගිණුම්කරණ පිළියම යෙදිය යුතුය. |
| (ඇ) | මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව එජඩො මිලියන 115ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට එකඟ වී තිබූ අතර එය එජඩො මිලියන 90 දක්වා අඩු කර තිබුණි කෙසේ වෙතත්, එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2023 වර්ෂයේදී මෙම සංඛ්‍යාව හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල විශේෂ තොරතුරු හෙළිදරව් කළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| **නීතිරීති හා රෙගුලාසි වලට යොමුව** | **විගණන නිරික්ෂණ** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|
| 2016 මාර්තු 23 දිනැති අංක 1/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4.3 වගන්තිය. | 2022 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 24.5 දක්වා ප්‍රසාද දීමනාව ව්‍යාපෘතියේ අරමුදල් භාවිතා කරමින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි. | මෙය ලංකා විදුලිබල මණ්ඩල ප්‍රතිපත්තියට සහ සියලුම ලංකා විදුලිබල මණ්ඩල සේවකයින්ට අදාල මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදුවේ. | විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවලට අදාළ චක්‍රලේඛ උපදෙස් දැඩි ලෙස පිළිපැදිය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| අංකය | සංරචකය / උප සංරචකය | 2022 දෙසැම්බර් 31 දිනට | | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය භෞතික | මූල්‍ය | | |
| (අ) | **පැකේජය** 4<br>කිලෝ වොට් 270, කිලෝ වොට් 33 කුළුණු මාර්ග , 2 එස්එස්බීබී ගැන්ට්‍රි 13ක් ඉදිකිරීම. (270kV ,33kV tower lines 13Nos of 33kV 2 SSBB gantries) | 100 | 45.10 | 39.39 | කොන්ත්‍රාත්තුව 2019 මැයි 30 ප්‍රදානය කරන ලද අතර 2021 ඔක්තෝබර් 27 දින අවසන් කිරීමට නියමිත අතර ඉදිකිරීම්වල සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | ප්‍රමාදයට හේතු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | **පැකේජය 5**<br>ලොට් 1:<br>ද්‍රව්‍ය සැපයීම සහ බෙදා හැරීම: තෙකලා බලශක්ති මීටර සහ මොඩම (25,000ක්)<br>(Three phase energy meters and Modems) | 100 | 100 | 99 | "සම්පූර්ණ පද්ධතිය ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ පුහුණුව 2022 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණි. | එම |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

**පැකේජය 4** පාංශු විමර්ශනය සහ මාර්ග 5 ක කුළුණු ස්ථානගත කිරීම 100% අවසන් කර ඇත. මාර්ග 3ක් සඳහා පැතිකඩ සැලසුම් කිරීම 100% සම්පූර්ණ කර ඇත. අනෙකුත් සියලුම මාර්ග පාංශු විමර්ශනය සඳහා, කුළුණු ස්ථානගත කිරීම සහ පැතිකඩ සැලසුම් කිරීම 50% ට වඩා වැඩි වන අතර දිගටම සිදු කෙරෙමින් පවතී.වොයිසි මාර්ගයේ පැති කඩ සැලසුම් 80% ක් වන අතර කුළුණු ස්ථානගත කිරීම 90% ක් සම්පූර්ණ කර ඇත. මාතර මාර්ගයේ පාංශු පරීක්ෂාව සහ පැතිකඩ සැලසුම් කිරීම 80% අවසන් කර ඇත. මාර්ග 14 ක අත්තිවාරම් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර සිදුකරමින් පවතී. එම මාර්ග 14 න්, මාහෝ - මාළිය මාර්ගයේ අත්තිවාරම් 100% අවසන් කර ඇත. මාර්ග 3 ක කුළුණු ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර සිදු වෙමින් පවතී. අත්තිවාරම ඉදිකිරීම 45.25% අවසන් කර ඇත. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 52.29% වන අතර මූල්‍ය ප්‍රගතිය 55.58% කි.

**පැකේජය 5** ඉතිරි ගෙවීම "සම්පූර්ණ පද්ධතිය ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ පුහුණුව (පුහුණු ස්ථානය: ශ්‍රී ලංකාව)" සඳහා වේ.

| **විගණකගේ නිර්දේශය** | | |
|---|---|---|
| | **පැකේජය 4** | වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සම්පව නිරීක්ෂණය කළ යුතුය. |
| | **පැකේජය 5** | මිලදී ගත් උපකරණ ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට හැකි වන පරිදි සැපයුම්කරුගෙන් අවශ්‍ය පුහුණුව ලබා ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. . |

## 3.2 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියට පැවරූ දේපළ, පිරියත සහ උපකරණ වාර්තා කිරීම සඳහා විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට ව්‍යාපෘතිය විසින් ක්‍රියා කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් මූල්‍ය ශාඛාව DD 1 සහ ව්‍යාපෘති අංශයේ නිසි පරිදි පවත්වාගෙන යනු ලබන අතර එය විගණනයේදී විගණකවරුන් වෙත ඉදිරිපත් කර ඇත. | ස්ථාවර වත්කම් ලේඛනයක් අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

## 3.3 ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධ ගැටළු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විදුලිබල මණ්ඩලයට ගැන්ට්‍රි ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් 16ක් පවරා ගැනීමට අපේක්ෂා කළද ඉඩම් කොටස් 4ක් පමණක් පවරාගෙන තිබුණි. | ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සියලුම ඉඩම් කොටස් අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |